## 10 වන ශ්‍රේණිය

# ඉතිහාසය

## විෂය නිර්දේශය
## (2007 වර්ෂයේ සිට 10 වන ශ්‍රේණිය සඳහා)

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

2006

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 1.0 හැඳින්වීම

ඉතිහාසය ඉගෙනීම යනු මානව ශිෂ්ඨාචාරයේ වර්ධනයේ දී සිදු වූ දේශපාලන, ආර්ථික, සමාජීය , ආගමික සහ සංස්කෘතික ක්ෂේත්‍රවල මතු වූ ගැටළු සහ ජයග්‍රහණවල විවිධාකාර ස්වභාවය තුලනාත්මකව හා විවේචනාත්මකව අවබෝධ කර ගැනීමයි. එය පරිසරය හා ජාතික උරුමයන් රැකගනිමින් සියළු මනුෂ්‍ය වර්ගයාට එක්ව විසීමට හැකි යහපත් සමාජයක් ගොඩනැගීමේ අරමුණු පෙරදැරි වන්නක් විය යුතු යි.

2007 වසරේ සිට ක්‍රියාත්මක විමට නියමිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරන තුළින් ද 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉතිහාසය පාසල් විෂය මාලාවේ හර විෂයක් ලෙසින් ඇතුලත් කර ඇත. මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන පාසල් විෂය මාලාව නිපුණතා පාදකව සකස් වේ.
6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා වූ ඉතිහාසය විෂයමාලාව ද සැලසුම් කිරීමේ දී ද හඳුනාගත් විෂය නිපුණතා පදනම් කරගෙන සකස් කරන ලදි.

10 වන ශ්‍රේණියේ සඳහා වූ මෙම විෂය නිර්දේශය ද එහි ප්‍රතිඵලයකි. මෙය 2007 වසරේ සිට ක්‍රියාත්මක විමට නියමිතයි. තේමා එකොලහකින් සමන්විත මෙම විෂය නිර්දේශයට ශ්‍රී ලංකාව හා ලංකාව සම්බන්ධයෙන් බලපෑමක් ඇති කළ ලෝකයේ ඓතිහාසික සිදුවීම් ද තේමා සඳහා තෝරා ගෙන ඇත.

## 2.0 විෂයයේ පොදු නිපුණතා

- ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ දැනුවත් වෙයි.
- වර්තමානය තේරුම් ගැනීම සඳහා අතීතය පිළිබඳ දැනුම ඉවහල් කරගත හැකි ආකාරය විමර්ෂණය කරයි.
- ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මකව බැලීමට හැකි ආකල්ප වර්ධනය කර ගනියි.
- වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන ආශ්‍රයෙන් ජාතික අගයන් ගොඩ නගා ගනියි.
- ඉතිහාසය ඇසුරෙන් ජාතික අනන්‍යතාවය හඳුනා ගැනීමට පෙළෙඹෙයි.
- ඉතිහාසයෙන් ඉදිරිපත් කෙරෙන හර පද්ධතීන් වර්තමාන සංසිද්ධීන් සඳහා ඵලදායිව භාවිත කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 3.0 10 ශ්‍රේණියට අදාළ නිපුණතා

- ඉතිහාසය හැදැරීමට අදාළ මූලාශ්‍ර විමර්ශණය කරයි.
- ඉන්දියාවේ ඓතිහාසික වර්ධනය අධ්‍යයනය කරයි.
- පොළොන්නරු යුගයේ අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ඓතිහාසික වර්ධනය අධ්‍යයනය කරයි.
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරය යනු කුමක් දැයි විග්‍රහ කරයි.
- මධ්‍යකාලීන ලෝකයේ වැදගත් ඓතිහාසික සිදුවීම් අධ්‍යයනය කරයි.
- යුරෝපා ජාතීන්ගේ බල ව්‍යාප්තිය සිදු වූ ආකාරය අධ්‍යයනය කරයි.
- ශ්‍රී ලංකාව හා බටහිර ජාතීන් අතර පැවැති සබඳතා විග්‍රහ කරයි.
- යුරෝපයේ වැදගත් ඓතිහාසික සංසිද්ධීන් අධ්‍යයනය කරයි.

ඉහත නිපුණතාවන් වර්ධනය වීමෙන් පහත දැක්වෙන අරමුණු කරා ශිෂ්‍යයින් ළඟා වෙතැයි අපේක්ෂා කෙරේ.

- ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධතීන් පිළිබඳව අභිමානවත් හැඟුමෙන් කටයුතු කරයි.
- ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථාන හා ස්මාරක වල පිහිටීම හඳුනාගනියි.

## 4.0 පාසලේ ප්‍රතිපත්ති හා වැඩ සටහන්

ඉතිහාසය විෂය නිර්දේශයේ අන්තර්ගතය විෂය කරුණු සාර්ථකව හා ඵලදායි ලෙස අධ්‍යයනය කිරීමටත් ඒ තුළින් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහාත් ශිෂ්‍ය සහභාගීත්වය වර්ධනය වන ආකාරයට පාසල් වැඩ සටහන් සම්පාදනය කර ගැනීම අතිශයින් ම ප්‍රයෝජනවත් ය. එම වැඩ සටහන් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ජීවිතයට මෙන්ම ඔවුන් අයත් වන ප්‍රජාවගේ යහ පැවැත්වමට ද ප්‍රයෝජනවත් වන ඒවා විය යුතු ය.

මෙහි යෝජනා කොට ඇත්තේ එවැනි පාසල් වැඩ සටහන් කිහිපයක් පමණි. මේ අනුව වෙනත් නිර්මාණාත්මක වැඩ සටහන් හා ප්‍රතිපත්ති සකස් කර ගැනීමේ නිදහස ඉතිහාසය උගන්වන ගුරුවරයාට හිමි වන බව සලකන්න.

- ඉතිහාසය සංගමයක් පිහිටුවීමෙන් සිසු දැනුම ප්‍රවර්ධනය සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, වාද විවාද, ප්‍රදර්ශන, සඟරා, බිත්ති පුවත් පත් නිර්මාණය යන කාර්යයන්ට යොමු කළ හැකි ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- යටත් පිරිසෙයින් වසරකට වරක්වත් ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථානයකට හෝ ප්‍රදේශයකට අධ්‍යාපන චාරිකා සංවිධානය කළ හැකිය. පන්ති කාමරයේ දි ලබාගත් දැනුම තහවුරු කර ගැනීමට හා වර්ධනය කර ගැනීමට හැකි වන පරිදි පූර්ව සැලසුමකින් යුත ව අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම වැදගත් වෙයි.
- පුද්ගල සම්මන්ත්‍රණ මගින් දිවයිනේ පිළිගත් ඉතිහාසඥයින් පාසලට කැඳවා ඔවුන්ගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට අවස්ථා සැලසිය හැකිය.
- පුරා වස්තු විනාශයට යමින් පවතින මෙවන් යුගයක ප්‍රදේශයේ පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්මාරක පිළිබඳ සොයා බැලීම හා ඒවා ආරක්ෂා කිරීම සඳහා පාසල හා සම්බන්ධ ප්‍රජා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පුළුවන.
- ඉතිහාසය පාඩම්වලට අදාළ වන චිත්‍ර, මූර්ති, කැටයම් හා වෙනත් කෞතුක වස්තු නිරීක්ෂණය කිරීමටත්, නිරීක්ෂණ වාර්තා සැපයීමටත් හැකි වන පරිදි කෞතුකාගාර වැඩ සටහන් සංවිධානය කිරීම යෝග්‍ය වෙයි.

## 5.0 ඉගැන්වීමේ උපාය මාර්ග හා කාලපරිච්ඡේද

ඉතිහාසය උගන්වන ගුරුවරයා, තොරතුරු ලබා දෙන්නෙකුට වඩා තොරතුරු ලබා ගැනීමට තම සිසුන් පොළඹවන්නකු ලෙස කටයුතු කරන්නේ නම් ඉගැන්වීමේ කාර්යය වඩා ඵලදායි වනු ඇත. මේ සඳහා හැකි සෑම අවස්ථාවකදීම සාකච්ඡාව, මූලාශ්‍ර පරිහරණය, නිරීක්ෂණය වැනි කාර්යයන්ට සිසුන් යොමු කිරීම මැනවි. ඉතිහාසය අර්ථාන්විතව අධ්‍යයනය කිරීම සඳහා සිසුන් යොමු කරවිය හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.

- ජාතික කෞතුකාගාර සහ ප්‍රාදේශීය කෞතුකාගාර යනාදිය මගින් සැලසුම් කළ වැඩ සටහනක් යටතේ කෞතුක වස්තු නැරඹීමට අවස්ථාව සැලසීම. සිසුන් ප්‍රදේශයේ ඉතිහාසය සෙවීමට උනන්දු කර ඒ මගින් ජාතික ඉතිහාසය වෙත යොමු කිරීම.
- මාධ්‍යවලින් තොරතුරු ලබා ගැනීමට අවස්ථාව සැලසීම. (ගුවන් විදුලි හා රූපවාහිනී අධ්‍යාපන සේවා)
- ඓතිහාසික වැදගත්කමින් යුත් ස්ථාන නැරඹීමට උනන්දු කරවීම.
- මූලාශ්‍ර භාවිතයට උනන්දු කරවීම.
- සිසු කුසලතාවලට අවස්ථා සැලසෙන පරිදි බිත්ති පුවත් පත් සඟරා , ප්‍රදර්ශන , පාසල් කෞතුකාගාර ඇරඹීම වැනි කටයුතු කෙරෙහි ධෛර්යය දීම.
- කාලීන ප්‍රශ්න දෙස මධ්‍යස්ථව හා යථාර්ථවාදීව බැලිය හැකි ඵලදායි පුරවැසියකු බිහි කිරීමේ කාර්යයට ඉතිහාසය විෂය ඉගැන්වීමෙන් ඔබට දායක විය හැකිය. ඒ සඳහා ඔබ සතු වගකීම ඉතා විශාලය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

යෝජිත කාලපරිච්ඡේද

| **6 ශ්‍රේණිය** | **විෂය ඒකක** | **කාලපරිච්ඡේද** |
|---|---|---|
| | 10.1 | 03 |
| | 10.2 | 06 |
| | 10.3 | 12 |
| | 10.4 | 12 |
| | 10.5 | 06 |
| | 10.6 | 11 |
| | 10.7 | 10 |
| | 10.8 | 05 |
| | 10.9 | 07 |
| | 10.10 | 06 |
| | 10.11 | 12 |
| | **එකතුව** | 90 |

## 6.0 තක්සේරුකරණය හා ඇගයුම

පරික්ෂණ හා ඇගයුම කාර්ය පහත සඳහන් ආකාරයට සංවිධානය කිරීම සුදුසුය.

පන්ති කාමරය තුළ ඇගයුම්

ලිඛිත පරික්ෂණ, වාචික පරික්ෂණ, ව්‍යාපෘති වැඩ වැනි ක්‍රියාමාර්ග වලින් සංවිධානය කර ගත හැක ය. මේ සඳහා පාසල පදනම් කරගත් ඇගයුම් ක්‍රියාවලියේ දක්වා ඇති නිදර්ශන අනුසාරයෙන් ඇගැයීම් උපකරණ සකසා ගැනීම ප්‍රයෝජනවත්ය.

වසර අවසානයේ ඇගයුම්

වසර අවසානයේ පවත්වන පාසල් මට්ටමේ හෝ කලාපීය මට්ටමේ හෝ පළාත් මට්ටමේ ලිඛිත පරික්ෂණයකට සිසුන් ඉදිරිපත් කළ හැකිය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ඉතිහාසය විෂය නිර්දේශය
## 10 ශ්‍රේණිය

ඒකකය 10.1

නිපුණතා:

- ඉතිහාසය විෂය හැදෑරීමට අදාළ මූලාශ්‍ර විමර්ශනය කරයි.

අනු නිපුණතා

- ඉතිහාසය යන්න අර්ථ දක්වයි / නිර්වචනය කරයි.
- ඉතිහාසය ඉගෙනීමේ වටිනාකම පරීක්ෂා කරයි.
- ඉතිහාසය ඉගෙන ගැනීමට හැකි මූලාශ්‍ර විග්‍රහ කරයි

විෂය අන්තර්ගතය — කාලපරිච්ඡේද 03

10.1 ඉතිහාසය හඳුන්වාදීම
- 10.1.1 ඉතිහාසය යනු කුමක් ද?
- 10.1.2 ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන
- 10.1.3 ඓතිහාසික මූලාශ්‍ර
  - සාහිත්‍යමය මූලාශ්‍ර
    - දේශීය
    - විදේශීය
  - පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර
    - කාසි
    - සෙල්ලිපි
    - නටබුන්

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- ඉතිහාසය සඳහා ඇති නිර්වචන රැස් කිරීම.
- ඉතිහාසයට ඉගෙනීමේ අවශ්‍යතාවය පිළිබඳ රචනයක් නිර්මාණය කරයි.
- ඉතිහාසය ගොඩ නැගීම සඳහා ඓතිහාසික මූලාශ්‍රවල වැදගත්කම යන මාතෘකාවෙන් වාර්තාවක් සකස් කිරීම.

ගුණාත්මක යෙදවුම්

- ඉතිහාසය සම්බන්ධ නිර්වචන

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 10.2

නිපුණතා

- ඉන්දියාවේ ඓතිහාසික වර්ධනය අධ්‍යයනය කරයි.

අනු නිපුණතා

- ඉන්දියාවේ ආර්ය ජනාවාස විමර්ශනය කරයි.
- සොළොස් මහා ජනපද සිතියමක් ඇසුරින් විස්තර කරයි.
- මෞර්ය අධිරාජ්‍යයේ ව්‍යාප්තියට දායක වූ රජවරු පිළිබඳ පරීක්ෂා කරයි.
- ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය අධ්‍යයනය කරයි.
- ගුප්ත යුගයේ සංස්කෘතික කාර්යය සංසිද්ධි විග්‍රහ කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 06

10.2 ඉන්දියාවේ ආර්ය ජනාවාස පිහිටීම
- 10.2.1 ඉන්දියාවේ ආර්ය ජනාවාස
- 10.2.2 සොළොස් මහා ජනපද
- 10.2.3 මෞර්ය අධිරාජ්‍යය
- 10.2.4 ගුප්ත අධිරාජ්‍යය

යෝජිත ඉගෙනුම ක්‍රියාකාරකම්

- ඉන්දියාවේ ආර්ය ජනාවාස ව්‍යාප්තිය සිතියමක ලකුණු කිරීම.
- සොළොස් මහා ජනපද සිතියමක ලකුණු කිරීම.
- මෞර්ය අධිරාජ්‍යයේ නැගීම දැක්වෙන සිතියම් සකස් කිරීම.
- ගුප්ත අධිරාජ්‍යයේ නැගීම සිතියම් ගත කිරීම.
- මෞර්ය හා ගුප්ත කලා කෘතිවල පින්තූර රැස් කිරීම.

ගුණාත්මක යෙදවුම්.

- සාරානාත් කුළුණු හිස, සාරානාත් බුදු පිළිමය, සාංචි ස්ථූපය, අජන්තා චිත්‍ර ආදි පින්තූර.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 10.3

නිපුණතා

- පොළොන්නරු යුගයේ අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ඓතිහාසික වර්ධනය අධ්‍යයනය කරයි.

අනු නිපුණතා

- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු පරීක්ෂා කරයි.
- ආර්ය ජනාවාස පිහිටුවීම පිළිබඳව අධ්‍යයනය කරයි.
- පොළොන්නරු යුගයේ අවසානය දක්වා සිටි වැදගත් වූ රජවරුන්ගේ කාර්ය සංසිද්ධීන් විග්‍රහ කරයි.
- දකුණු ඉන්දීය ආක්‍රමණ අධ්‍යයනය කරයි.

විෂය අන්තර්ගතය — කාලපරිච්ඡේද 12

10.3 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පොළොන්නරු යුගයේ අවසානය දක්වා.

10.3.1 ප්‍රාග් ඓතිහාසික යුගය.
- ප්‍රාග් ඓතිහාසික ස්ථාන හඳුනා ගැනීම.
- ප්‍රාග් ඓතිහාසික මිනිසාගේ ජීවන රටාව.

10.3.2 ආර්ය ජනාවාස පිහිටු වීම.
- විජය කථා පුවත
- ජනාවාස ව්‍යාප්තිය
- ආර්යන්ගේ දේශපාලන , ආර්ථික සහ සමාජ සංස්කෘතික ක්‍රමය.

10.3.3 පොළොන්නරු රාජධානියේ බිඳවැටීම දක්වා දේශපාලන ඉතිහාසය.
- රාජත්වය පිහිටුවීම
- රජවරු

  පණ්ඩුකාභය, දේවානම්පියතිස්ස, එළාර, දුටුගැමුණු, කාශ්‍යප, දෙවන අග්බෝ, හතරවැනි මහින්ද,පස්වැනි මහින්ද, පළමුවැනි විජයබාහු, මහා පරාක්‍රමබාහු හා නිශ්ශංකමල්ල.
- දකුණු ඉන්දියානු ආක්‍රමණ

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- ප්‍රාග් ඓතිහාසික ස්ථාන සිතියමක ලකුණු කිරීම.
- බලංගොඩ මානවයාගේ කල්පිත රූපය ඇසුරින් ප්‍රාග් ඓතිහාසික මිනිසාගේ ජීවන රටාව හඳුනා ගැනීම.
- ආර්ය ජනාවාස ව්‍යාප්තිය සිතියමක ලකුණු කිරීම.
- පොළොන්නරු රාජධානිය අවසානය දක්වා ශ්‍රී ලංකා ඉතිහාසයේ වැදගත් රජවරු හා ඔවුන් විසින් කළ සේවා දැක්වෙන වගුවක් සකස් කිරීම.
- පොළොන්නරු සමයේ එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ සහ ඉන් ඇති වූ ප්‍රතිඵල පිළිබඳ පුවත් පතකට ලිපියක් සැකසීම.

ගුණාත්මක යෙදවුම්

- ප්‍රාග් ඓතිහාසික ස්ථාන දැක්වෙන ලංකා සිතියම.
- බලංගොඩ මානවයාගේ කල්පිත රූපය.
- ආර්ය ජනාවාස ව්‍යාප්ත සිතියම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 10.4

නිපුණතා:

ජලාශ්‍රිත ශිෂ්ටාචාරය යනු කුමක්දැයි විග්‍රහ කරයි.

අනු නිපුණතා

- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වාරි තාක්ෂණය පිළිබඳව අධ්‍යයනය කරයි.
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පාලන සංවිධානය සකස් වූ ආකාරය පරීක්ෂා කරයි.
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ආර්ථික රටාව විග්‍රහ කරයි.
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ආගම හා සංස්කෘතිය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි.
- විදේශ සම්බන්ධතා විග්‍රහ කරයි.
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානිය අධ්‍යයනය කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 12

10.4 ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ වර්ධනය හා එහි පරිහානිය

10.4.1 වාරිමාර්ග හා වාරි තාක්ෂණය.

- ආරම්භය හා වර්ධනය
  කුඩා වැවේ සිට මහවැව් දක්වා.
- වැව් සහ ඇළ මාර්ග පද්ධතිය.
- වාරි තාක්ෂණය : වැවක ප්‍රධාන කොටස්
- ඇළ මාර්ග හා බැදුණු තාක්ෂණය

10.4.2 පාලන සංවිධානය

- මධ්‍යම පාලනය
- පළාත් පාලනය

10.4.3 ආර්ථික රටාව

- කෘෂිකර්මය
- කර්මාන්ත
- වෙළෙඳාම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

10.4.5 ආගම හා සංස්කෘතිය

- බුද්ධාගම
  - රජු හා ආගම
  - බෞද්ධ මතවාද
- හින්දු ආගම්
- වෙනත් ආගම්
- සංස්කෘතිය ,ජන ජීවිතය, කලාශිල්ප , ගෘහ නිර්මාණ, අධ්‍යාපනය, සාහිත්‍ය

10.4.6 විදේශ සම්බන්ධතා

- රාජ්‍ය තාන්ත්‍රික
- සංස්කෘතික

10.4.7 ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානිය

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- රජරට වාරිමාර්ග පද්ධතිය දැක්වෙන සිතියමක් සකස කිරීම.
- වැවක ආකෘතියක් නිර්මාණය කිරීම.
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පාලන සංවිධානය පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ආර්ථික රටාව පිළිබඳ විමර්ශනය කොට සාකච්ඡා කිරීම.
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ආගමික ගොඩනැගිලිවල පින්තූර රැස් කර ඒ මගින් ආගම හා සංස්කෘතිය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වීම.
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානියට බලපෑ හේතු පැහැදිලි කිරීමේ බුද්ධි මණ්ඩල සාකච්ඡාවක් මෙහෙයවීම.

ගුණාත්මක යෙදවුම්

- වැව් හා වාරි මාර්ග දැක්වෙන ලංකා සිතියමක්
- වැවක ආකෘතියක්
- රජරට ශිෂ්ටාචාරයට අයත් ආගමික ගොඩනැගිලිවල පින්තූර.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 10.5

නිපුණතා

- මධ්‍යකාලීන ලංකාවේ වැදගත් ඓතිහාසික සිදුවීම් අධ්‍යයනය කරයි.

අනු නිපුණතා

- දහතුන්වන සියවසේ සිට පහළොස්වනි සියවස දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික ආගමික සහ ජන ජීවිතයේ සිදු වූ වෙනස්කම් විග්‍රහ කරයි.
- ශ්‍රී ලංකාවේ දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා කලාව, ගෘහනිර්මාණ හා සාහිත්‍ය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ රාජධානි සිතියමක් ඇසුරින් විස්තර කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 06

10.5 දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස අවසානය දක්වා ශ්‍රී ලංකාව
- 10.5.1 දේශපාලන ඉතිහාසය
- 10.5.2 ආර්ථික රටාවේ වෙනස්වීම්
- 10.5.3 ජන ජීවිතය
- 10.5.4 ආගම, සාහිත්‍ය, කලාව හා ගෘහ නිර්මාණ

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ රාජධානි සිතියමක ලකුණු කිරීම.
- දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන , ආර්ථික, සමාජයීය හා ආගමික තත්ත්වයන් විමසා බැලීමට කණ්ඩායම් ක්‍රියාකාරකමක යෙදවීම.
- දහතුන්වන සියවසේ සිට පහළොස්වැනි සියවස දක්වා බිහි වූ සාහිත්‍ය කෘති ලැයිස්තුවක් සකස් කිරීම.
- දහතුන්වන සියවසේ සිට පහළොස්වන සියවස දක්වා කාලයට අයත් කලා හා ගෘහ නිර්මාණ පින්තූර රැස් කිරීම.

ගුණාත්මක යෙදවුම්

- මධ්‍යකාලීන යුගයේ රාජධානි සිතියම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 10.6

නිපුණතා:

- මධ්‍යකාලීන ලෝකයේ වැදගත් ඓතිහාසික සිදුවීම් අධ්‍යයනය කරයි.

අනු නිපුණතා

- මධ්‍යකාලීන ආසියාවේ දේශපාලන තොරතුරු එක්රුස් කර විස්තර කරයි.
- මධ්‍යකාලීන ආසියාවේ සංස්කෘතික කටයුතු අධ්‍යයනය කරයි.
- මධ්‍යකාලීන ආසියාතික රටවල් අතර පැවැති සබඳතා විමසා බලයි.
- මධ්‍යකාලීන ආසියාවේ ඓතිහාසික ස්ථාන සිතියමක් ඇසුරින් විස්තර කරයි.

විෂය අන්තර්ගතය                                                            කාලපරිච්ඡේද 11

10.6 මධ්‍යකාලීන ආසියාව

10.6.1 ඉස්ලාම් ධර්මයේ ව්‍යාප්තිය සහ ඉන්දියාව කෙරෙහි එය බලපෑ ආකාරය.

- වයඹ දිග හා බටහිර ඉන්දියාව
- දිල්ලි සුල්තාන් අධිරාජ්‍යය
- මෝගල් අධිරාජ්‍යය
- ඩෙකෑනයේ බහමනි රාජ්‍යය
- විජයනගර් අධිරාජ්‍යය

10.6.2 බුදු දහම හා හින්දු ධර්මය ආසියාව කෙරෙහි ඇති කළ බලපෑම්

- මධ්‍යම ආසියාව
- චීනය
- බුරුමය (මියැන්මාර්)
- සියම (තායිලන්තය)
- ජාවා සුමාත්‍රා
- කාම්බෝජය (කම්පුචියාව)

10.6.3 අග්නිදිග ආසියාව හා ශ්‍රී ලංකාව අතර පැවැති සම්බන්ධතා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

යෝජිත ඉගෙනුම් ක්‍රියාමාර්ග

- මධ්‍යකාලීන ඉන්දියාව තුළ ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත වූ ප්‍රදේශ සිතියමක ලකුණු කොට නම් කිරීම.
- මධ්‍යකාලීන ආසියාවේ බෞද්ධ හා හින්දු බලපෑම් පිළිබිඹු කෙරෙන තොරතුරු හා පින්තූර රැස් කර කේෂ්ත්‍ර පොතක් පිළියෙළ කිරීම.
- මධ්‍යකාලීන යුගයේ ශ්‍රී ලංකාව හා අග්නිදිග ආසියාතික රටවල් සමග පැවැති දේශපාලන හා සංස්කෘතික සම්බන්ධතා තොරතුරු ඇතුළත් වගුවක් සකස් කිරීම.

ගුණාත්මක යෙදවුම්

- මධ්‍යකාලීන ආසියා සිතියම
- මධ්‍යකාලීන ආසියාවේ ආගමික ගොඩනැගිලිවල පින්තූර.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 10.7

නිපුණතා

- මධ්‍යකාලීන ලෝකයේ වැදගත් ඓතිහාසික තොරතුරු සිදුවීම් අධ්‍යයනය කරයි.

අනු නිපුණතා

- යුරෝපයේ පැවැති වැඩවසම් ක්‍රමය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- කුරුස යුද්ධ සමග වෙළෙඳාම දියුණු වූ ආකාරය විස්තර කරයි.
- පුනරුද යුගයේ යුරෝපයේ ඇති වූ වෙනස්කම් අධ්‍යයනය කරයි.
- යුරෝපයේ බිහි වූ ජාතික රාජ්‍යවල ලක්ෂණ පැහැදිලි කරයි.
- දේශගවේෂණ ව්‍යාපාරයේ වැදගත් අවස්ථා සිතියමක් ඇසුරින් විස්තර කරයි.
- යුරෝපයේ පැවැති ආගමික ප්‍රතිසංස්කරණ විග්‍රහ කරයි.

විෂය අන්තර්ගතය — කාලපරිච්ඡේද 10

10.7 මධ්‍යකාලීන යුරෝපයේ දේශපාලන ආර්ථික හා සංස්කෘතික අභිවර්ධනය

- 10.7.1 වැඩවසම් ක්‍රමය
- 10.7.2 කුරුස යුද්ධ හා වෙළෙඳාමේ දියුණුව
- 10.7.3 පුනරුදය
- 10.7.4 යුරෝපයේ ජාතික රාජ්‍ය
- 10.7.5 දේශ ගවේෂණය
- 10.7.6 ආගමික ප්‍රතිසංස්කරණය

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ සාකච්ඡා කිරීම.
- යුරෝපයේ පුනරුද සමයේ ඇති වූ දියුණුව පිළිබඳ ව පහත සඳහන් මාතෘකා යටතේ පොත් පිංචක් සකස් කිරීම.
    - විද්‍යාත්මක සොයා ගැනීම්
    - කලා හා ගෘහ නිර්මාණ
    - ශාස්ත්‍රීය.
- යුරෝපයේ බිහි වූ ජාතික රාජ්‍ය පිළිබඳ පුවත් පතක් සඳහා ලිපියක් සකස් කිරීම.
- දේශගවේෂණ ගමන් මාර්ග සිතියමක් සකස් කිරීම.

ගුණාත්මක යෙදවුම්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- දේශ ගවේෂකයින්ගේ ගමන් මාර්ග සහිත ලෝක සිතියම.

ඒකකය 10.8

නිපුණතා

- යුරෝපා ජාතීන්ගේ බල ව්‍යාප්තිය සිදු වූ ආකාරය අධ්‍යයනය කරයි.

අනු නිපුණතා

- යුරෝපා ජාතීන් යටත් විජිත සොයා යාමට හේතු වූ කරුණු විමසා බලයි.
- යුරෝපා ජාතීන් තම ආධිපත්‍ය පිහිටුවාගත් රටවල් සිතියමක් ඇසුරින් විස්තර කරයි.
- ක්‍රිස්තු ධර්මයේ ව්‍යාප්තිය සිදු වූ ආකාරය පරීක්ෂා කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 05

10.8 යුරෝපා බලව්‍යාප්තිය.

10.8.1 ස්පාඤ්ඤය . පෘතුගාලය, ඕලන්දය, එංගලන්තය, ප්‍රංශය, බෙල්ජියම, ඩෙන්මාර්කය.

10.8.2 ක්‍රිස්තුධර්මයේ ව්‍යාප්තිය

- රෝමානු කතෝලික ආගම.
- රෙපරමාදු ආගම.

යෝජිත ඉගැනුම් ක්‍රියාකාරකම්

- ආසියා , අප්‍රිකා හා ලතින් ඇමරිකානු රටවල යුරෝපා බල ව්‍යාප්තිය දැක්වෙන සිතියමක් සකස් කිරීම.
- යුරෝපා ජාතීන් ආසියා , අප්‍රිකා හා ලතින් ඇමරිකානු රාජ්‍ය වලින් ලබාගත් ආර්ථික ප්‍රයෝජන වගුගත කිරීම.

ගුණාත්මක යෙදවුම්

- යුරෝපා බල ව්‍යාප්තිය දැක්වෙන සිතියම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 10.9

නිපුණතා-

- ශ්‍රී ලංකාව හා බටහිර ජාතීන් අතර පැවති සබඳතා විග්‍රහ කරයි.

අනු නිපුණතා

- කෝට්ටේ , යාපනය සහ සීතාවක රාජධානි සමග පෘතුගීසීන් පැවැත් වූ සබඳතා විග්‍රහ කරයි.
- බටහිර ජාතීන් සමග මහනුවර රාජධානිය සමග පැවැත් වූ සම්බන්ධතා විමසා බලයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 07

10.9 ශ්‍රී ලංකාව හා බටහිර ජාතීන්

10.9.1 කෝට්ටේ , යාපනය, සීතාවක රාජ්‍යයේ පෘතුගීසීන් සමග පැවැත් වූ සම්බන්ධතා

10.9.2 මහනුවර රාජධානිය සමග පෘතුගීසීන් , ලන්දේසීන් හා ඉංග්‍රීසීන්, පැවැත් වූ සම්බන්ධතා

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කෝට්ටේ රාජ්‍යය හා පෘතුගීසීන් සමග පැවැති සම්බන්ධතා පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වීම.
- "සීතාවක පළමුවැනි රාජසිංහ රජු පෘතුගීසීන් මෙරටින් පළවා හැරීමට අනුගමනය කළ ප්‍රතිපත්තිය" යන මැයෙන් බිත්ති පුවත් පතකට ලිපියක් සැපයීම.

ගුණාත්මක යෙදවුම්

- කෝට්ටේ යාපනය, සීතාවක හා මහනුවර රාජධානි ලකුණු කළ සිතියම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 10.10

නිපුණතා

- යුරෝපයේ වැදගත් ඓතිහාසික සංසිද්ධීන් අධ්‍යයනය කරයි.

අනු නිපුණතා

- කාර්මික විප්ලයට අදාළ නව නිෂ්පාදන පිළිබඳ තොරතුර ඉදිරිපත් කරයි.
- කාර්මික විප්ලව සමයේ ඇති වූ  නව නිමැවුම් පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි.
- කාර්මික විප්ලවයේ හිතකර හා අහිතකර බලපෑම් විග්‍රහ කරයි.
- කාර්මික විප්ලවය පැතිරි ගිය ප්‍රදේශ සිතියමක් ඇසුරින් විස්තර කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 06

10.10 කාර්මික විප්ලවය

10.10.1 ආරම්භය හා වර්ධනය.

10.10.2 නව නිමැවුම්

10.10.3 ප්‍රතිඵල

- දේශපාලන
- ආර්ථික
- සමාජයීය

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- කාර්මික විප්ලවයට අදාළ නව නිමැවුම් හා ඒවා නිපද වූ පුද්ගලයන් පිළිබඳ නාම ලේඛනයක් සකස් කිරීම.
- කාර්මික විප්ලවයට සම්බන්ධ නව නිෂ්පාදනවල පින්තූර රැස් කිරීම.
- කාර්මික විප්ලවයේ යහපත් / අයහපත් ප්‍රථිඵල ඉස්මතු වන ආකාරයේ විවාදයක් / දෙබසක් /සංවාදයක්.
- කාර්මික විප්ලවය පැතිරිගිය ප්‍රදේශය සිතියමක ලකුණු කර නම් කිරීම.

ගුණාත්මක යෙදවුම්

1. කාර්මික විප්ලයට සම්බන්ධ නව නිමැවුම් පිළිබඳ ලේඛනයක් / පින්තූර.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 10.11

නිපුණතා

- යුරෝපයේ වැදගත් ඓතිහාසික සංසිද්ධීන් අධ්‍යයනය කරයි.

අනු නිපුණතා

- ප්‍රංශ විප්ලවයෙන් දිනාගත් අයිතිවාසිකම් පිළිබඳව විස්තර කරයි.
- ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරය හා ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාර තුළින් ජාතික වාදය හා මානව වාදය පැන නැගුන ආකාරය පැහැදිලි කරයි.
- රුසියන් විප්ලවය තුළින් නව ආර්ථික හා දේශපාලන චින්තනය නිර්මාණය වූ ආකාරය විස්තර කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 12

10.11 යුරෝපා නව දේශපාලන චින්තනයේ වර්ධනය

10.11.1 මානව වාදය.
- ප්‍රංශ විප්ලනය

10.11.2 ජාතික වාදය , ලිබරල් වාදය
- ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරය
- ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරය.

10.11.3 සමාජ වාදය
- රුසියන් විප්ලවය

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- ප්‍රංශ විප්ලව ඇසුරින් මානව වාදය පැන නැගුණ අයුරු සාකච්ඡාවක් මෙහෙය වීම .
- ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරය හා ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාර තුළින් ජාතික වාදය හා ලිබරල් වාදය මතු වූ , ආකාරය පිළිබඳව බුද්ධිමණ්ඩල සාකච්ඡාවක් මෙහෙය වීම.
- රුසියන් විප්ලය ඇසුරින් සමාජවාදය මතු වූ ආකාරය පුවත් පතකකට ලිපියක් සකස් කිරිම.

ගුණාත්මක යෙදවුම්

- යුරෝපයේ සිතියම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.